

# ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව
ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය

43 වන වෙළුම 03 වන කලාපය 2019 ISSN -1991-040X





# දිවංගත හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 36 වන ගුණ සමරුව

දිවංගත කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍ය හෙක්ටර් කොබ්බෑකඩුව ශ්‍රීමතාණන්ගේ 36 වැනි ගුණ සමරුව පසුගිය සැප්තැම්බර් 18 දිනට යෙදී තිබුණි. ඒ නිමිත්තෙන් හෙක්ටර් කොබ්බෑකඩුව සංසදය විසින් සංවිධානය කළ ගුණ සමරු වැඩසටහනක් ආයතන පරිශ්‍රයේ දී පවත්වන ලදී.

මෙම ගුණ සමරු වැඩසටහනට හිටපු අග්‍රාමාත්‍ය දි.මු ජයරත්න, හිටපු අමාත්‍ය නිමල් සිරිපාල ද සිල්වා, හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී රාජා කොල්ලුරේ යන මහත්වරු මෙන් ම හෙක්ටර් කොබ්බෑකඩුව මහතාගේ ඥාතීහු ද සහභාගී වූහ.

කෘෂිකර්ම හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් ඒ මහතා ඉටු කළ අනුපමේය මෙහෙය සහ ඉඩම් ජනසතු කිරීම වෙනුවෙන් සිදු කළ මෙහෙවර මෙහි දී කෘතවේදීව සිහිපත් කෙරුණි.

1995 වර්ෂයේ දී ‘ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය’ මෙතුමාට උපහාරයක් වශයෙන් ‘හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය’ යනුවෙන් නාමගත කරන ලද්දේ කෘෂිකාර්මික සංවර්ධනය විෂයෙහි එතුමාගේ දායකත්වය සිහිකිරීමට කෘතගුණ දැක්වීමක් වශයෙනි.

# ‘Managing Development: People, Policies and Institutions’

## කෘතිය දොරට වැඩීම

**ගොවි**කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ පළමු අධ්‍යක්ෂවරයා වන සී.නාරායනසාමි මහතා විසින් රචිත ‘Managing Development: People, Policies and Institutions’ කෘතිය දොරට වැඩීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී අගෝස්තු 29 දින පැවැත්වුණි. අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතාගේ එහි ප්‍රධාන ආරාධිතයා විය.

කෘතිය සහ කතුවරයා පිළිබඳ හඳුන්වා දීම කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතනයේ ජ්‍යෙෂ්ඨ උපදේශක ලොයිඩ් ප්‍රනාන්දු මහතා විසින් සිදු කළ අතර කෘතිය එළි දැක්වීම වෙනුවෙන් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ භූමිකාව පිළිබඳ හැඳින්වීමක් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යංශ ලේකම් එම්.ඩබ්.කේ ගුණතිලක මහත්මිය විසින් සිදු කළා ය. හිටපු ජනාධිපති ලේකම්වරයෙකු වූ කේ.එච්.ජ් විජේදාස මහතා විසින් කෘතියෙහි වැදගත් තැන් පිළිබඳව පැමිණ සිටි පිරිසට හැඳින්වීමක් ද සිදු කළේය.

දශක හතරකට වැඩි කාලයක් සංවර්ධන කළමනාකරණය පිළිබඳව කතුවරයා විසින් ලබා ඇති අත්දැකීම් ඔස්සේ මෙම කෘතියෙහි කරුණු ඉදිරිපත් කර තිබේ. සංවර්ධන කළමනාකරණයට අදාළව පාලනය, ආයතන ගොඩනැගීම, ගොවිජන ප්‍රතිසංස්කරණ සහ ග්‍රාමීය සංවර්ධනය සහ අධීක්ෂණය හා ඇගයීම යන වැදගත් තේමාවන් හතරක් ඔස්සේ කරුණු මනා පෙළගැස්මකින් යුතුව මෙම කෘතිය ඉදිරිපත් කර තිබීම ද කැපී පෙනේ.

උගත් පාඩම් හා සංවර්ධන කළමනාකරණයට එහි අදාළතාව පිළිබඳ දේශනයක් මහ බැංකු අධිපති ඉන්ද්‍රජිත් කුමාරස්වාමි මහතා විසින් සිදු කළේය.













## ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතා වැඩබලන අධ්‍යක්ෂ ධූරයට

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ නව වැඩ බලන අධ්‍යක්ෂ ධූරයට ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී දුමින්ද ප්‍රියදර්ශන මහතා පත් විය. ඒ මහතා මීට පෙර අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ අංශ ප්‍රධාන ලෙස කටයුතු කර ඇති අතර ජීවන වියදම් පිළිබඳ අමාත්‍ය අනුකාරක කමිටු සාමාජිකයෙකු ලෙස ද කටයුතු කරයි.

# දැනට ක්‍රියාත්මක වන අධ්‍යයන

## ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් බෙදාදීමේ අභිමතාර්ථ හා වත්මන් භාවිතාවන් අතර අනුකූලතාව



ඉඩම් නොමැති පුද්ගලයින් හට නේවාසික සහ කෘෂිකාර්මික කටයුතු සිදු කිරීම සඳහා රජය සතු ඉඩම් බෙදා දීම 1935 අංක 19 දරන ඉඩම් සංවර්ධන ආඥා පනත සම්මත කර ගැනීම හරහා විධිමත් ලෙස සිදු විය. ඒ යටතේ රජයේ ඉඩම් බැහැර කිරීමේ ක්‍රියාවලිය දැනටත් ශ්‍රී ලංකාව පුරා අඛණ්ඩව සිදු කරමින් පවතී.

එම ඉඩම් නියමාකාරයෙන් සංවර්ධනය කර ජනතාව නිසි ප්‍රයෝජන අත්විඳිනවාද සහ ඒ ඔස්සේ ඉඩම් සංවර්ධන ආඥා පනත මගින් අපේක්ෂිත අරමුණු කොතෙක් දුරට ඉටුකර ගැනීමට ජනතාව සමත් වී තිබෙනවාද යන්න පිළිබඳ ගැඹුරු හා විද්‍යාත්මක විශ්ලේෂණයන්ට බඳුන් කර ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා ප්‍රමාණවත් පිටිවහලක් ලබා දී නොමැත.

ඉඩම් විෂයානුබද්ධ ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ ද අදහස වනුයේ වර්තමානය වන විට බැහැර කළ රජයේ ඉඩම්වල ඵලදායිතාවය ප්‍රශස්ත මට්ටමට ළඟා වී නොමැති බව ය. එවන් පසුබිමක් තුළ ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බෙදා දුන් රජයේ ඉඩම්වල වත්මන් භාවිතය හා සංවර්ධිත ස්වභාවය පිළිබඳ අධ්‍යනයක් සිදු කිරීම කාලීන අවශ්‍යතාවයක් බවට නිතැතින්ම පත්ව ඇත.

කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ පර්යේෂණ නිලධාරිනි දිනුෂා රත්නායක මහත්මියගේ මූලිකත්වයෙන් ඒ පිළිබඳ අධ්‍යයනයක් ආරම්භ කර තිබේ. ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ ඉඩම් බෙදා දීමේ මූලික පරමාර්ථයන් හා එකී පරමාර්ථයන්ට අනුව බැහැර කළ ඉඩම්වල වර්තමාන භාවිතය සහ සංවර්ධිත ස්වභාවය හඳුනා ගනිමින් ඒ අතර පවතින අනුකූලතාවය පිළිබඳ අධ්‍යනය එහි මූලික අරමුණයි.

එහිදී රජය විසින් දීමනාපත්‍ර නිකුත් කරන ලද ඉඩම්වල පදිංචිය සිදු වී ඇති ආකාරය හඳුනා ගැනීමටත් ඉඩම් පරිහරණයේ හා සංවර්ධනයේ ස්වභාවය මෙන්ම ඵලදායිතාවය පිළිබඳ තක්සේරු කිරීමටත් බලාපොරොත්තු වේ. එසේම මෙම අධ්‍යනය හරහා ඉඩම් උපයෝජනය තුළින් ජනතාව අපේක්ෂා කරන සැබෑ අරමුණු ඉටුකර ගැනීමට ඉවහල් වන වඩා ඵලදායි ඉඩම් බැහැර කිරීමේ ක්‍රියාවලියක් සඳහා අවශ්‍ය ප්‍රතිපත්තිමය යෝජනා ඉදිරිපත් කිරීමටද සැලසුම් කර තිබේ.

ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාපයන් නියෝජනය වන පරිදි රජයේ ඉඩම් බහුලව බෙදා දී ඇති ගාල්ල, අනුරාධපුරය සහ කුරුණෑගල යන දිස්ත්‍රික්ක තුන අධ්‍යයන ප්‍රදේශ ලෙස තෝරා ගන්නා ලදී. එසේම අධ්‍යයන නියැදිය ලෙස ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ දීමනා පත්‍ර හිමි ඉඩම්ලාභීන් 401ක් සම්මුඛ සාකච්ඡාවට භාජනය කරමින් තොරතුරු රැස් කරන ලදී. කෘෂි සම්පත් කළමනාකරණ අංශයේ තුෂාරා ධර්මවර්ධන මහත්මිය සහ අමල් දිසානායක මහතා සම පර්යේෂකවරු ලෙස කටයුතු කරති.





# මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම ආශ්‍රිත ජල කළමනාකරණ ගැටලු පිළිබඳ අධ්‍යයනය

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණුකිරීමේ ආයතනයේ පාරිසරික හා ජලසම්පත් කළමනාකරණ අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි ඩබ්.එච්.ඒ. ශාන්ත මහතා ඇතුළු පර්යේෂණ කණ්ඩායමක් විසින් මධ්‍ය කඳුකරයේ නැගෙනහිර බෑවුම ආශ්‍රිත ජල කළමනාකරණ ගැටලු පිළිබඳ අධ්‍යයනයක් සිදු කරමින් පවතී.

මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම් ආශ්‍රිත ප්‍රදේශය ආර්ථික, දේශගුණික හා පාරිසරික වශයෙන් ඉතා වැදගත් මෙන් ම ඉතා සංවේදී කලාපයකි. දේශගුණික විපර්යාසයන්ගේ බලපෑම නිසා මෙම ප්‍රදේශය නිරන්තරයෙන් ම දේශගුණික විචල්‍යතාවයන්ට ලක් වන අතර තීව්‍ර වර්ෂාපතනය නිසා නායයෑම් අවදානම් සහිත මෙන් ම දිගු වර්ෂා රහිත වියළි කාලපරිච්ඡේද හා නියඟ තත්ත්වයන්යට නිරතුරුවම පාත්‍ර වන ප්‍රදේශයකි.

මෙම කලාපයේ කෘෂිකර්මාන්තය ප්‍රධාන වශයෙන් වර්ෂාපෝෂිත හා ප්‍රධාන ජල මූලාශ්‍රයන් වන ඉහළ කඳු බෑවුම් වලින් ගලා එන ගංගා, දියපහරවල් හා ඇළ මාර්ග මත පදනම් වේ. මෙම කලාපය සතුව පවතින සීමිත ජල සම්පත, ජල මූලාශ්‍ර ආශ්‍රිතව සකස් කර ඇති අමුණු හරහා කෘෂිකාර්මික කටයුතු සඳහා අවශ්‍ය වාරි ජලය ලෙස යොදා ගනී. කෘෂිකර්මාන්තයට අමතරව ක්ෂුද්‍ර විදුලි ජනන බලාගාර, ප්‍රජා ජල සම්පාදනය හා තේ වතු ආශ්‍රිතව සිදු කෙරෙන සූක්ෂම එළවළු බෝග වගාව වැනි විවිධ අංශ වෙත විවිධ පාර්ශවකරුවන් විසින් භාවිතයට ගනු ලබයි.

ඉහළ ජල පෝෂක ප්‍රදේශ වල ඇති වන ඝනත්වය අඩුවීම හා වෙනත් මිනිස් ක්‍රියාකාරකම් හේතුවෙන් ප්‍රදේශයට ජලය සැපයෙන කුඩා ඇල මාර්ග හා දිය පහර දැඩි බලපෑමකට ලක් වී තිබේ. මෙම තත්ත්වය හමුවේ පහළ උච්ඡත්වය සහිත ප්‍රදේශවල සිදු කරන ලබන යැපුම් හා සුළු පරිමාණ කෘෂිකර්මාන්තයේ නියුතු ගොවි ප්‍රජාවන්ගේ ජීවනෝපාය හා ඔවුන්ගේ සාමාන්‍ය ජන ජීවිතය දැඩි බලපෑමකට ලක්ව පවතී.

මෙම පාර්ශවකරුවන් අතර සීමිත ජල සම්පත සඳහා පවතින උග්‍ර තරඟකාරීත්වය හා එයට බලපා ඇති හේතු සාධක පිළිබඳ නිසි අධ්‍යයනයක් මේ දක්වා සිදු ව නොමැත. එබැවින්, මෙම තත්ත්වය නිසා කෘෂිකර්මාන්තය ජීවනෝපාය කොටගත් ගොවි ප්‍රජාවන්ට සිදු වන බලපෑම අධ්‍යයනය කිරීම හා අදාල ගැටලුව සඳහා සියලු පාර්ශවකරුවන්ගේ පිළිගැනීමට ලක් කළ හැකි ජල කළමනාකරණ යාන්ත්‍රයක් යෝජනා කිරීම අරමුණු කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කරනු ලබයි.

මෙම ව්‍යාපෘතියේ සම පර්යේෂකයන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ජී.ජී.ඩී.එල්.ඩබ්. සමරසිංහ මහත්මිය, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි එම්.ඒ.සී.එස්. බණ්ඩාර මහතා, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනී ටී.පී. මුණවීර මහත්මිය යන අය කටයුතු කරති.

# අවසන් කළ අධ්‍යයන

**හෙළ** බොජුන්හල් කෙරෙහි ඇති පාරිභෝගික රුචිකත්වය සහ වර්තමාන තත්ත්වය පිළිබඳව විමසා බැලෙන සමාජ ආර්ථික පර්යේෂණයක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති හා ව්‍යාපෘති ඇගයීමේ අංශය විසින් සිදු කර තිබේ. එම අංශයේ ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සුසිලා ලූර්දු මහත්මිය විසින් මෙම අධ්‍යයනය හෙළ බොජුන් හල් 11ක් ඇසුරින් සිදු කර තිබේ.



## කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට අයත් හෙළ බොජුන්හල් සහ එහි කාන්තාවන් පිළිබඳ වත්මන් ප්‍රගතිය ඇගයීමේ අධ්‍යයනය

කෘෂිකර්ම දෙපාර්තුමේන්තුව මඟින් ආරම්භ කර ක්‍රියාත්මක කරනු ලබන හෙළ බොජුන්හල්හි ප්‍රධාන අරමුණ වන්නේ, හෙළ බොජුන් හල් වැඩසටහන සඳහා කාන්තාවන් සම්බන්ධ කර ගනිමින් ඔවුන් ව්‍යවසායිකාවන් ලෙස පුහුණු කර තිරසර ව්‍යවසායක කාර්යයන් සඳහා යොමු කිරීම හරහා ඔවුන්ගේ පවුලේ ආදායම ඉහළ නැංවීමයි.

2004 වර්ෂයේ සිට මේ දක්වා ක්‍රියාත්මක කෙරෙන මෙම හෙළ බොජුන් හල් වැඩසටහන පිළිබඳ වත්මන් ක්‍රියාකාරීත්වය, එහි ප්‍රධාන අරමුණ ඉටු වීම පිළිබඳව ඇති ප්‍රගතිය සහ වැඩසටහන තවදුරටත් සාර්ථක වීමට සුදුසු දිශානතීන් හඳුනා ගැනීමේ පුළුල් අරමුණින් 2018/2019 වර්ෂයේ දී මෙම වැඩසටහන විධිමත් ඇගයීමකට ලක් කරන ලදී.

අපේක්ෂිත අරමුණු ඉටු කරමින් හෙළ බොජුන්හල් මඟින් ග්‍රාමීය කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව හැකියා වැඩි වර්ධනය වී ඇති අතර ඔවුන්ගේ ආදායම් ඉපයීමේ හැකියාව ද ඉහළ ගොස් ඇති බව මෙම අධ්‍යයනය මඟින් හඳුනා ගෙන ඇත.

ග්‍රාමීය කාන්තාවන් ව්‍යවසායිකාවන් ලෙස පුහුණු කර ඔවුන් තිරසාර ව්‍යවසායක කාර්යයන් සඳහා යොමු කිරීමේ කාර්යය සිදු කිරීම හරහා ඔවුන්ගේ පවුලේ ආදායම ඉහළ නැංවීමත්, වස විසෙන් තොර දේශීය ආහාර පරිභෝජන රටාවකට ජනතාව නැඹුරු කරවීමත්, ඒ හරහා දේශීය ආහාර ප්‍රවර්ධනය ඇති කිරීමත් සඳහා හෙළ බොජුන් හල් වැඩසටහන ඉහළ මට්ටමින් දායක වී ඇති බව අධ්‍යයනය මඟින් වැඩි දුරටත් පෙන්වා දී තිබේ. මෙම වැඩසටහනෙහි තිරසාරභාවය වැඩි දුරටත් ඉහළ නැංවීම සඳහා අධ්‍යයනය තුළින් යෝජනා රැසක් ඉදිරිපත් කර තිබේ.

අධ්‍යයනයේ සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනි සාගරිකා හිටිහාමු මහත්මිය සහ ජ්‍යෝෂ්ඨ පර්යේෂණ නිලධාරිනි දිලූපා බමුණු ආරච්චි මහත්මිය කටයුතු කරති.







# ශ්‍රී ලංකාවේ කාලගුණ හා දේශගුණ දත්ත මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදයෙහි කාර්ය සාධනය තක්සේරු කිරීම පිළිබඳ අධ්‍යයනය

**ආ**හාර අලෙවි ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රෝෂිණී රඹුක්වැල්ල මහත්මිය විසින් ක්‍රියාත්මක කොට දැනට නිර්දේශ ඉදිරිපත් කර ඇති මෙම අධ්‍යයනයේ අරමුණ ලංකාවේ කාලගුණික හා දේශගුණික දත්ත මත පදනම් වූ බෝග (වී සඳහා) රක්ෂණ ක්‍රමවේදය ඇගයීමට ලක් කිරීමයි.

මෙම අධ්‍යයනයෙන් ප්‍රධාන වශයෙන් වී වගාව සම්බන්ධයෙන් අවධානය යොමු කළ අතර ද්විතියික දත්ත සහ තොරතුරු එකරැස් කිරීම ප්‍රධාන වශයෙන් සිදු කරන ලද්දේ සණස රක්ෂණ සමාගම ඇසුරෙනි.

අධ්‍යයනය මඟින් කාලගුණ වගා රක්ෂණ ක්‍රමයේ පවතින වාසි සහ අවාසිදායක තත්ත්වයන් පිළිබඳව කරුණු ඉදිරිපත් කර තිබේ.

අධ්‍යයනයේ සොයා ගැනීම්වලට අනුව කාලගුණික හා දේශගුණික දත්ත මත පදනම් වූ රක්ෂණ ක්‍රමවේදය සඳහා සහභාගීත්වය මුළු වී ගොවීන්ගෙන් 0.5%කට වඩා අඩු මට්ටමක පවතී. කාලගුණ වගා රක්ෂණ ක්‍රමය පිළිබඳ ගොවීන්ගේ දැනුම ඉතා අඩු මට්ටමක පැවතීම, ස්වේච්ඡාවෙන් රක්ෂණ වාරික ගෙවීමට අකමැති වීම හා නොහැකියාව වැනි කරුණු මෙන්ම විවිධ හේතු මත එම ක්‍රමය පිළිබඳ ඇති අප්‍රසාදය ද ඒ සඳහා හේතු වී ඇත.

නිර්දේශ ඉදිරිපත් කරමින් පර්යේෂණ කණ්ඩායම සඳහන් කරනුයේ කාලගුණ මධ්‍යස්ථාන ප්‍රමාණය ඉහළ දැමිය යුතු බවත් අඛණ්ඩව හා ගුණාත්මක දත්ත ලබා ගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කළ යුතු බවත්ය. ගොවීන් දැනුවත් කිරීමට අමතරව රක්ෂණ ක්‍රියාවලිය සඳහා ගොවි සංවිධාන සම්බන්ධ කර ගැනීම ද එමඟින් නිර්දේශ කර ඇත.

ආහාර අලෙවි ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය විසින් මෙහෙයවන අධ්‍යනයේ සම පර්යේෂකවරුන් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන දුමින්ද ප්‍රියදර්ශන මහතා සහ රුවිනි විදානපතිරණ මහත්මිය ද පර්යේෂණ නිලධාරිනි ජයමිණි චම්පිකා මෙනවිය ද කටයුතු කරති.

## දේශගුණික විපර්යාස බලපෑම පිළිබඳ පාසල් සිසුන් දැනුවත් කිරීමේ වැඩමුළුව



**දේ**ශගුණික විපර්යාස සහ එහි බලපෑම පිළිබඳ පාසල් දරුවන්ගේ දැනුම සහ අවබෝධය ඉහළ නැංවීම මුල් කර ගත් වැඩමුළුවක් පාරිසරික හා ජල සම්පත් කළමනාකරණ අංශය විසින් 2019.07.08 දින සංවිධානය කරනු ලැබිණි. දේශගුණික විපර්යාස මඟින් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික හා සෙසු අංශයන් කෙරෙහි ඇති කරනු බලපෑම පිළිබඳ පාසැල් සිසුන් දැනුවත් කිරීම වැඩමුළුවේ අරමුණයි.

මාලඹේ ශ්‍රී රාහුල බාලිකා මහා විද්‍යාලයේ සිසුවියන් පිරිසක් වැඩමුළුවට සහභාගී වූ අතර දේශන, වීඩියෝ දර්ශන සහ විවෘත සාකච්ඡා වැනි විවිධ මාදිලි ඔස්සේ කරුණු ඉදිරිපත් කිරීම සිදු විය. මෙම වැඩමුළුව ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි ගීතානි සමරසිංහ මහත්මිය විසින් සම්බන්ධීකරණය කරනු ලැබූ අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීන් වන ඩබ්.එච්.ජේ. ශාන්ත මහතා, සිදත් බණ්ඩාර මහතා සහ තිලනි පද්මජානි මහත්මිය සම්පත් දායකයින් ලෙස සහභාගී වූහ.

# ගොවි සංවිධාන සවිබලගැන් වීමේ පුහුණු වැඩසටහන් මාලාව



මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය මගින් මෙහෙයවනු ලබන 'නීරෝගී පරපුරක් සඳහා කෘෂිකර්මාන්තය පිළිබඳ පුහුණු වැඩසටහන්' මාලාවේ තවත් වැඩසටහන් කිහිපයක් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉලක්ක කර ගෙන පැවැත්විණි.

කෘෂි රසායන භාවිතයෙන් ජනිත වන සෞඛ්‍යමය ගැටලු අවම කිරීම තුළින් නීරෝගීමත් පරපුරක් බිහි කිරීම සඳහා අවශ්‍ය දැනුම ආකල්ප හා කුසලතා වර්ධනය කිරීම මෙම පුහුණු වැඩසටහන්හි ප්‍රධාන අරමුණයි.

2019 සැප්තැම්බර් මස 09 දින සිට සැප්තැම්බර් මස 27 දක්වා දිනයන්හි පූනෑව, රඹෑව, ඇතාකඩ, මැදවච්චිය, කල්ලංචිය, කැබිතිගොල්ලෑව, පදවිය, ගලෙන්බිදුණු වැව, කහටගස්දිගිලිය, හොරොව්පතාන, රත්මල්ගහවැව හා කෝන්වැව යන ගොවිජන සේවා මධ්‍යස්ථානයන් හි මෙම පුහුණු වැඩසටහන් සංවිධානය කර තිබුණි.

'සිතමු' කාන්තා ගොවි සංවිධාන සාමාජිකාවෝ හා ගොවි සංවිධාන නායකයෝ මෙම පුහුණු වැඩසටහන් හි පුහුණු ලාභීහු වූහ.

මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශයේ අංශ ප්‍රධාන, අධි පර්යේෂක එස්.එම්.ජ් සමරකෝන් සහ පර්යේෂණ නිලධාරී සංගීත් ප්‍රසාද් ප්‍රනාන්දු යන මහත්වරු මෙම වැඩසටහනේ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන අතර අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ විෂයබද්ධ නිලධාරීන් සහ අනුරාධපුර පළාත් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලයේ කෘෂිකර්ම උපදේශකවරුන් ද මෙහි සම්පත් දායකවරු ලෙස කටයුතු කරති.







# ගොවිකටයුතු පුවත් හසුන

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ගොවිකටයුතු ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබා ගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකි ය.


**උපදේශකත්වය**

දුමින්ද ප්‍රියදර්ශන

අධ්‍යක්ෂ / ප්‍රධාන විධායක නිලධාරී (වැ.බ)

**අධීක්ෂණය**

එස්.ඒ.සී.යූ සේනානායක

ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

**සම්පාදනය**

වසන්ති රාජපක්ෂ

ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනි

**නිර්මාණකරණය**

උදේනි කරුණාරත්න

ගොවිකටයුතු පුවත් හසුන ප්‍රකාශනය' මුද්‍රණය සහ බෙදා හැරීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය

දුරකථනය - 0112 696981, ෆැක්ස් - 0112 692423

වෙබ් www.harti.gov.lk ෆේස්බුක්




## යහපත් කෘෂිකාර්මික පිළිවෙත් තව දුරටත් ප්‍රචලිත කිරීම සඳහා වැඩමුළුවක්

'යහපත් කෘෂිකාර්මික පිළිවෙත්' (Good Agricultural Practices -GAP) තව දුරටත් ප්‍රචලිත කිරීම අරමුණු කර ගනිමින් එම වැඩසටහනෙහි පාර්ශවකරුවන් සඳහා වූ වැඩමුළුවක් 2019 අගෝස්තු මස 21 දින හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී පවත්වන ලදී.

'යහපත් කෘෂිකාර්මික පිළිවෙත්' යනුවෙන් හඳුන්වන්නේ පාරිසරික, ආර්ථික හා සමාජීය තිරසාර බව සහතික කරමින් සෞඛ්‍යාරක්ෂිත හා ගුණාත්මක එළවළු හා පලතුරු නිෂ්පාදනය කර ගැනීම සඳහා සිදු කරනු ලබන පිළිවෙත්ය ලෙස සරලව අර්ථ දැක්විය හැකිය. 2015 වර්ෂයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් මෙම පිළිවෙත් හඳුන්වා දී තිබේ. මේ වන විට යහපත් කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කරමින් බෝග වගා කිරීම පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු, මධ්‍යම රජයේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා මහවැලි ව්‍යාපාරයන් හි ද ක්‍රියාත්මක වෙමින් පවතී.

එම ආයතනයන්ට සම්බන්ධ ආයතන සහ GAP ක්‍රමය භාවිතා කර වගා කර මහා පරිමාණ ගොවි මහතුන් ද වැඩමුළුවට එක් වී සිටියහ. මේ අවස්ථාව සඳහා කෘෂිකර්ම, ග්‍රාමීය ආර්ථික කටයුතු, වාරිමාර්ග සහ ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම් කේ.ඩී.එස් රුවන් චන්ද්‍ර මහතා ඇතුළු නිලධාරීහු රැසක් සහභාගී වූහ.

